# විෂය නිර්දේශය

(පළමුවන ප්‍රධාන අවධිය සඳහා)

# මව්බස

## පළමුවන ශ්‍රේණිය

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

ප්‍රාථමික අධ්‍යාපන ඒකකය
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකා

2007

# විෂය නිර්දේශය

## මව්බස (සිංහල) - පළමුවන ශ්‍රේණිය

## 01. හැඳින්වීම

මව්බස විෂය අන්තර්ගතය සවන් දීම, කතා කිරීම්, කියවීම, ලිවීම වශයෙන් ක්ෂේත්‍ර හතරක් යටතේ ඉදිරිපත් කර ඇත. ගුරුවරයාට විෂය අන්තර්ගත කරුණු පැහැදිලි කර ගැනීමට පහසු වනු පිණිස එසේ ඉදිරිපත් කර ඇතත් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගැනීමේ දී මෙම ක්ෂේත්‍ර අදාළ පරිදි සමෝධානය කර ගැනීම අපේක්ෂා කෙරේ.

2007 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන නිපුණතා පාදක ප්‍රවේශයේ දී, මූලික නිපුණතාවක් ලෙස සාක්ෂරතාව සඳහන් කෙරේ. එහි දී, සාවධානව ඇහුම්කන් දීම, පැහැදිලි ව කතා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව හා නිරවුල් ව ලිවීම, ඵලදායී අයුරින් අදහස් හුවමාරු කර ගැනීම යන නිපුණතා කරා සිසුන් ළඟා කරවීම අපේක්ෂිත ය.

මෙම සන්නිවේදන නිපුණතාවලට අමතර ව පරිසරයට අදාළ නිපුණතා, වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතාව, ආචාර ධර්මවලට හා ආගමට අදාළ නිපුණතා, ක්‍රීඩා හා විවේකය ප්‍රයෝජනයට ගැනීම පිළිබඳ නිපුණතා, පෝෂණය වර්ධනයට අදාළ නිපුණතා ඉගෙනීමට ඉගෙනීම පිළිබඳ නිපුණතා යන අනෙක් නිපුණතා වර්ධනය වන ලෙසින් විෂයයට අදාළ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගැනීම අපේක්ෂා කෙරේ.

## 02. (අ) ප්‍රාථමික අධ්‍යාපන අවධිය සඳහා නිපුණතා

* එදිනෙදා අවශ්‍යතා සඳහා සවන් දීමේ, කතා කිරීමේ කියවීමේ හා ලිවීමේ හැකියා ප්‍රදර්ශනය කරයි.
* කවි, ගී, කතන්දර අසා සහ කියවා රස විඳියි.
* නිවැරදි උච්චාරණය සහිත ව ශබ්ද නගා කියවයි.
* ක්‍රමවත් ව පැහැදිලි ව හා නිවැරදි ව ලියයි.
* සවන්දීම, කතා කිරීම, කියවීම හා ලිවීම සම්බන්ධ හොඳ පුරුදු ප්‍රදර්ශනය කරයි.
* පොත් පත් කියවා තේරුම් ගනියි. රස විඳියි.
* තම අත්දැකීම් වාර්තා කිරීමට හා අදහස් නිර්මාණාත්මක ව ප්‍රකාශ කිරීමේ හැකියා ප්‍රදර්ශනය කරයි.
* සමූහයක් ඉදිරිපිට තම අදහස් සුහද ව, නිරවුල් ව හා ආචාරශීලී ව ඉදිරිපත් කරයි.

### (ආ) පළමුවන ශ්‍රේණියේ අපේක්ෂිත නිපුණතා

* වින්දනාත්මක ව හා අවබෝධයෙන් යුතු ව සවන් දෙයි.
* අවශ්‍ය කරුණු විමසා දැන ගනියි.
* වාචික ව තම අදහස් ප්‍රකාශ කරයි.
* නිවැරදි ව උච්චාරණය කරමින් කියවයි.
* කියවමින් අවබෝධ කර ගනියි.
* ලිවීමේ ශිල්පීය දක්ෂතා ප්‍රදර්ශනය කරයි.
* වචන නිවැරදි ව ලියයි.
* සරල අදහස් ලියා ප්‍රකාශ කරයි.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 03. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

පළමුවන ශ්‍රේණිය සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කිරීමේ දී ක්‍රීඩා වැඩි වශයෙනුත්, ක්‍රියාකාරකම් අවශ්‍ය පරිදිත්, අසුන්ගත වැඩ අඩුවෙනුත්, යොදා ගැනීම අපේක්ෂා කෙරේ. මෙහි දී කුඩා කණ්ඩායම් වැඩ, විශාල කණ්ඩායම් වැඩ, පන්තියම කණ්ඩායමක් ලෙස ගෙන කරන වැඩ සහ තනි වැඩ අදාළ පරිදි සැලසුම් කර ගැනීම අවශ්‍ය ය.

මව්බස විෂය නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ දී, ඒ හා බැඳුණු පෙළ පොත සහ වැඩ පොත යොදා ගත යුතු ය. ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයෙන් බොහෝ ක්‍රීඩා සහ ක්‍රියාකාරකම් සඳහා මඟ පෙන්වීම් කෙරේ. පෙළ පොත සහ වැඩ පොත ද මේ සඳහා යොදා ගත හැකි ය.

නිපුණතා කරා ළඟා වීම සඳහා අවශ්‍ය තැන්වල දී පෙළ පොත සහ වැඩ පොත ද යොදා ගැනීම අපේක්ෂා කෙරේ. ඒ සඳහා ද මඟ පෙන්වීම් ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයෙහි අන්තර්ගත වේ. පෙළ පොත භාවිතයේ දී නිර්මාණශීලී ඉගෙනුම් ක්‍රම යොදා ගනිමින් සිසුන් තුළ නිර්මාණශීලී භාවය ඇති කිරීම ද අපේක්ෂා කෙරේ.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 04. පාසල් ප්‍රතිපත්ති හා වැඩ සටහන්

මව්බස විෂය හා බැඳුණු වැඩ සටහන් රාශියක් පාසල තුළ ක්‍රියාත්මක වේ.

* උදෑසන රැස්වීම්
* පන්ති රැස්වීම්
* විවිධ ප්‍රසංග
* ප්‍රදර්ශන
* සිහිනි පොළ
* ආගමික වැඩ සටහන්
* ගුරු දෙගුරු දින ඉන් සමහරකි.

ඉහත දැක්වෙන පාසල් වැඩ සටහන්වල දී සිසුන්ගේ භාෂා නිපුණතා වර්ධනය සඳහා පහත දැක්වෙන ක්‍රියාකාරකම් නිර්මාණශීලී ව යොදා ගත හැකි වේ.

එනම්,

* කථන ක්‍රියාකාරකම්
* සාමූහික හා තනි තනි ව කෙරෙන ගායනා
* රංගන හා රූපණ ආශ්‍රිත ක්‍රියාකාරකම්

ඊට උදාහරණ ලෙස දැක්විය හැකි ය.

## 05. තක්සේරු කිරීම

මෙම ශ්‍රේණියේ දී මව්බස විෂය තුළ ලිඛිත පරීක්ෂණ වැනි ඇගයීම්වලට වඩා ප්‍රමුඛත්වය දිය යුතු වන්නේ සිසුන් සමඟ වැඩ කරමින් හා සිසුන්ගේ වැඩ නිරීක්ෂණය මගින් සිදු කරන ඇගයීම් විධිවලට ය. මව්බස ක්‍රියාකාරකම්,ක්‍රීඩා, පෙළ පොත සහ වැඩ පොත භාවිතය වැනි අවස්ථාවල දී නිරීක්ෂණය, සාකච්ඡා, වාචික ප්‍රශ්න වැනි තක්සේරු ක්‍රම මගින් පළමුවන ශ්‍රේණියට අදාළ නිපුණතා වර්ධනය වීම සිදුවන්නේ දැයි නිරතුරු ව ඇගයීමට ලක් කිරීම අපේක්ෂා කෙරේ.

## 06. ගෙදර වැඩ පැවරීම

- දිනපතා කළ වැඩ කොටස තහවුරු වීම සඳහා කළ යුතු ක්‍රියාකාරකම් ගෙදර වැඩ ලෙස ඉදිරිපත් කරන විට කතන්දර කවි, තේරවිලි ආදිය දෙමව්පිය වැඩිහිටියන්ගෙන් අසාගෙන ඒම පැවරිය හැකි ය.
- කළ යුතු දේ ගැන හා කරන ආකාරය පිළිබඳ ව ශිෂ්‍යයාට වැටහෙන සේ උදෙස් දෙන්න.
- දෙමව්පියන්/භාරකරුවන් ඔබට හමු වේ නම් ඒ පිළිබඳ ව ඔවුන්ට ද උපදෙස් දෙන්න.
- කියවීම හා ලිවීම සම්බන්ධව ඉගැන්වීම සඳහා වගකීම ඔබ ම භාර ගන්න. ඒ පිළිබඳ ව වැඩ පවරන්නේ නම් අකුරක් ලියන දිශාව උච්චාරණය කිරීම වැනි දෑ නිවැරදි ව ඔබ කියා දුන් ආකාරයට ම කිරීමට උපදෙස් දෙන්න.

පළමුවන ශ්‍රේණිය සඳහා වන මෙම විෂය නිර්දේශය පූර්ව භාෂා කුසලතා, සවන්දීම, කතා කිරීම්, කියවීම සහ ලිවීම යන ක්ෂේත්‍රවලින් සමන්විත ය. නිර්දේශ අන්තර්ගතය හඳුනා ගැනීමේ පහසුව සඳහා එසේ දක්වා ඇතත් මෙම ක්ෂේත්‍ර එකිනෙකට බැඳී පවතී. මෙහි දී ක්ෂේත්‍ර දෙකක් හෝ තුනක් හෝ සියල්ල ම හෝ සමෝධානය වන සේ ඉගෙනුම් කාර්යය සංවිධානය කර ගැනීම අපේක්ෂා කෙරේ.

1.0 පූර්ව භාෂා කුසලතා
 1.1 ශ්‍රවණ විභේදන හැකියා ප්‍රදර්ශනය කරයි
 - පරිසරයේ ඇති ශබ්ද වෙන් කර හඳුනා ගනියි
 - පරිසරයේ ස්වාභාවික ශබ්ද වෙන් කර හඳුනා ගෙන නම් කරයි
 - පරිසරයේ කෘත්‍රිම ශබ්ද වෙන් කර හඳුනා ගෙන නම් කරයි
 1.2 දෘෂ්ටි විභේදන හැකියා ප්‍රදර්ශනය කරයි
 - රූපවල ඇති සියුම් වෙනස්කම් දකියි
 - අකුරු රූප අතර වෙනස දකියි
 1.3 මනෝචාලක හැකියා ප්‍රදර්ශනය කරයි
 - වමේ සිට දකුණට ඇස යොමු කෙරෙන ක්‍රියාකාරකම්වල නිරත වෙයි
 - විශාල මාංශපේශි සම්බන්ධ ක්‍රියාකාරකම් සමඟ ඇස අත සමායෝජනය කරයි
 - සියුම් මාංශපේශි සම්බන්ධ ක්‍රියාකාරකම් සමඟ ඇස අත සමායෝජනය කරයි
 1.4 පෙර කියවීමේ හැකියා ප්‍රදර්ශනය කරයි
 - පින්තූර කියවයි
 - පින්තූර කතා කියවයි
 - අකුරු රූපය දකිමින් පින්තූරය කියවයි
 1.5 පෙර ලිවීමේ හැකියා ප්‍රදර්ශනය කරයි
 - ලිවීමේ උපකරණ නිවැරදි ව හසුවයි
 - නිදහසේ කුරුටුගායි
 - කඩ ඉරි මත හැඩ අඳියි
 - අකුරුවලට අයත් හැඩ අඳියි
 - කඩ ඉරිවලින් දෙන ලද අකුරු, රටා වශයෙන් අඳියි
 - අකුරු හැඩ, රටා වශයෙන් අඳියි

2.0 සවන්දීම
 2.1 සවන් දෙමින් වින්දනය ලබයි
 - නැළවිලි කවිවලට සවන් දෙමින් වින්දනය ලබයි
 - ළමා ගීවලට සවන් දෙමින් වින්දනය ලබයි
 - සරල කවිවලට සවන් දෙමින් වින්දනය ලබයි
 - සරල කතන්දරවලට සවන් දෙමින් වින්දනය ලබයි

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

2.2 අවධානයෙන් යුතු ව සවන් දෙයි
- විධානවලට සවන් දී ප්‍රතිචාර දක්වයි
- කතන්දරවලට සවන් දී ප්‍රතිචාර දක්වයි
- කවි / ගීවලට සවන් දී ප්‍රතිචාර දක්වයි

2.3 සවන් දී අවබෝධ කර ගනියි
- කෙටි විධානවලට සවන් දී අවබෝධ කර ගනියි
- සරල පණිවුඩවලට සවන් දී අවබෝධ කර ගනියි
- සරල උපදෙස්වලට සවන් දී අවබෝධ කර ගනියි

3.0 කතා කිරීම

3.1 ගායනා කරමින් අත්දැකීම් ලබයි
- ළමා කවි ගායනා කරයි
- ළමා ගී ගායනා කරයි

3.2 අවශ්‍යතා සඳහා කතා කරයි
- සුහද කතා බහේ යෙදෙයි
- තම අවශ්‍යතා සඳහා ප්‍රශ්න අසයි

3.3 සරල පණිවුඩ ගෙන යයි
- පන්තිය තුළ පණිවුඩ ගෙන යයි

3.4 කණ්ඩායමක් ඉදිරියේ කතා කරයි
- තම අත්දැකීම් කියයි
- ආරංචි කියයි
- කතන්දර කියයි

3.5 නිර්මාණාත්මක කථනයේ යෙදෙයි
- පින්තූරයක් ඇසුරෙන් කතා බහ කරයි
- පින්තූර කට්ටලයකින් කතන්දර ගොඩ නගයි

4.0 කියවීම

4.1 නිවැරදි ව උච්චාරණය කරමින් කියවයි
- පිල්ලම් රහිත අකුරු යෙදුණු වචන ශබ්ද නගා කියවයි
- ඇල පිල්ල යෙදුණු අකුරු සහිත වචන කියවයි
- උස් පිල්ල, උඩු පිල්ල ( හල් කිරීම් දෙක ) යෙදුණු අකුරු සහිත වචන කියවයි
- ඉස් පිල්ල යෙදුණු අකුරු සහිත වචන කියවයි
- දීර්ඝ ඉස් පිල්ල යෙදුණු අකුරු සහිත වචන කියවයි
- පා පිලි යෙදුණු අකුරු සහිත වචන කියවයි
- දීර්ඝ පා පිලි යෙදුණු අකුරු සහිත වචන කියවයි
- ඇද පිල්ල ( ඇදය ) යෙදුණු අකුරු සහිත වචන කියවයි
- දීර්ඝ ඇද පිල්ල (ඇදය) යෙදුණු අකුරු සහිත වචන කියවයි
- කොම්බුව යෙදුණු අකුරු සහිත වචන කියවයි
- කොම්බුව සහ ඇල පිල්ල යෙදුණු අකුරු සහිත වචන කියවයි
- කොම්බුව, ඇල පිල්ල සහ හල් කිරීම යෙදුණු අකුරු සහිත වචන කියවයි
- පිල්ලම් කිහිපයක් යෙදුණු අකුරු සහිත වචන කියවයි
- පිල්ලම් රහිත අකුරුවලින් යුතු වචන සහිත සරල වාක්‍ය කියවයි
- පිල්ලම් කිහිපයක් යෙදුණු අකුරු සහිත වචනවලින් යුතු සරල වාක්‍ය කියවයි
- නැවතීමේ ලකුණ ගැන සැලකිලිමත් ව සරල වාක්‍ය කියවයි

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

4.2 කියවා අවබෝධ කර ගනියි
- සරල වචන කියවමින් අවබෝධ කර ගනියි
- සරල වැකි කියවමින් අවබෝධ කර ගනියි

4.3 වාග්මාලාව පෝෂණය කර ගැනීම සඳහා කියවයි
- එක ම රටාවේ වචන කියවයි
- එක ම අකුරෙන් පටන් ගන්නා වචන කියවයි
- පන්තියේ සිසුන්ගේ නම් කියවයි
- තම පරිසරයේ ඇති ද්‍රව්‍යවල නම් කියවයි

5.0 ලිවීම

5.1 ලිවීමේ ශිල්පීය දක්ෂතා ප්‍රදර්ශනය කරයි
- අකුරක හැඩය හා නියමිත අංග සහිත ව ලියයි
- රූල මත අකුරු ලියයි

5.2 අර්ථවත් වචන ගොඩ නගා ලියයි
- පිල්ලම් රහිත අකුරු දෙකකට වැඩි නොවන අකුරු යෙදුණු වචන ලියයි
- පිල්ලම් රහිත අකුරු තුනකට වැඩි නොවන අකුරු යෙදුණු වචන ලියයි
- එක් පිල්ලමක් සහිත අකුරු තුනකට වැඩි නොවන අකුරු යෙදුණු වචන ලියයි

5.3 සන්නිවේදනය සඳහා ලියයි
- තමා පිළිබඳ ව මූලික තොරතුරු ලියයි (නම, ගම)
- අවට පරිසරයේ දක්නට ඇති දේවල නම් ලියයි
- පින්තූරයක් දෙස බලා එහි ඇති දේවල නම් ලියයි
- ගම්වල නම් ලියයි

5.4 අර්ථවත් වැකි ගොඩ නගා ලියයි
- යම් අදහසක් වචන දෙකකින් ලියයි
- වචන තුනකට අඩු නොවන සරල වැකි ලියයි

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.